**දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව - 2023**

**-----------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (I) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.6.2 (අ) නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද අනෙකුත් නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රමිතියේ පරිච්ඡේද අංක 3.28 අනුව මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වන මුදල් ප්‍රවාහය ගණනය කිරීමේ දී ක්ෂය කිරීම්වල බලපෑම ගැලපිය යුතු වුවද වර්ෂයේ ක්ෂය වටිනාකම වූ රු.48,909,098 ක් වෙනුවට රු.75,522,058 ක් මුදල් ප්‍රවාහයට එකතු කිරීම හේතුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය රු.26,612,960 කින් වැඩියෙන් පෙන්වා තිබුණි. | ඉදිරි මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී මෙම දෝෂය සිදු නොවනු ඇති බව. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව පිළියෙල කළ යුතුය. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020, 2021 හා 2022 වර්ෂවල මිලටගෙන තිබූ රු.3,648,339 ක් වූ පුස්තකාල පොත් හා සමාලෝචිත වර්ෂයේදී මිලටගෙන තිබූ රු.1,947,180 ක් වූ පුස්තකාල පොත් ජංගම නොවන වත්කම් ලෙස හඳුනා නොගෙන වියදම් යටතේ දක්වා තිබුණි. | පුස්තකාල පොත් සමීක්ෂණ වාර්තාව ලද පසු ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුව ජංගම නොවන වත්කම් ලෙස ගිණුම්වලට ගැනීමට කටයුතු කරන බව. | පුස්තකාල පොත් වත්කම් ලෙස ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශනවල මහජන බැංකුවේ ඉතුරුම් ගිණුමේ ශේෂය රු.42,192,789 ක් අඩුවෙන් ද ජංගම ගිණුමේ ශේෂය රු.42,192,789 ක් වැඩියෙන් ද දක්වා තිබුණි. | වැඩි ශේෂ ස්වයංක්‍රීයව ඉතිරි කිරීමේ ගිණුමට මාරු වන ක්‍රමවේදය අනුව ඉතිරි කිරීමේ ගිණුම හා ජංගම ගිණුම ඒකාබද්ධ ලෙස ගැනීමෙන් බැංකු සැසඳුම් පිළියෙල කිරීමට සිදු වන බව හා ඒකාබද්ධ ශේෂය මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබීම තුළ නිවැරදි ගිණුම් ශේෂ 2023 අවසාන ගිණුම් ශේෂවලින් පෙන්වා ඇති බව. | ගිණුම් ශේෂ වෙන වෙනම නිවැරදිව දැක්විය යුතුය. |
| (ඇ) | වත්කම් වගකීම් ප්‍රකාශයේ දේපළ හා පිරියතවල ශුද්ධ අගය ලෙස සටහන 16 ට අනුව රු.588,850,615 ක් දැක්විය යුතු වුවත් රු.853,362,503 ක් වූ පිරිවැය වටිනාකම දක්වා තිබීමෙන් වත්කම් රු.264,511,891 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2024 ගිණුමේ දී නිවැරදිව ක්ෂය වෙන් කිරීම් ගිණුමක් හා නිවැරදිව නොනිමි වැඩ ගිණුමක් හරහා ස්ථාවර වත්කම් ගිණුම් ගත කරන බව. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |
| (ඈ) | වත්කම් මිලදී ගන්නා වර්ෂයේදී ක්ෂය නොකරන බව ගිණුම් ප්‍රතිපත්තිවල සඳහන් වුවද සමාලෝචිත වර්ෂයේ දී මිලදී ගෙන තිබුණු වත්කම් සඳහා ක්ෂය ගණනය කර රු.3,271,819 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2024 අවසන් ගිණුමින් නිවැරදි කරන බව. | - එම - |
| (ඉ) | මූල්‍ය ප්‍රකාශනවල සටහන් 16 අනුව සමාලෝචිත වර්ෂයේදී සම්පූර්ණයෙන් ක්ෂය වූ ජංගම නොවන වත්කම් රු.11,051,891 ක පිරිවැය හා ක්ෂය වටිනාකම මුළු වත්කම්වල පිරිවැයෙන් හා මුළු ක්ෂය වටිනාකමින් ඉවත් කර වත්කම් බැහැර කිරීම් ලෙස දක්වා තිබුණි. | - එම - | - එම - |

| | | | |
|---|---|---|---|
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ දී මිලදී ගෙන තිබුණු පරිගණක වටිනාකම වූ රු.1,094,600 ක් ජංගම නොවන වත්කම් යටතේ ගිණුම්ගත නොකර වියදම් යටතේ දක්වා තිබුණි. | මෙවැනි තත්ත්වයක් ඉදිරියේදී ඇති නොවන බව. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |
| (උ) | මිලදී ගෙන තිබුණු කාර්යාල උපකරණ රු.10,165,196 ක සහ බඳුන් හා උපකරණ රු.2,049,442 ක වටිනාකම වියදම් යටතේ දක්වා තිබුණු හෙයින් වත්කම් ගිණුම් රු.12,214,638 ක් අඩුවෙන් දක්වා තිබුණි. | - එම - | - එම - |
| (ඌ) | වායු සමීකරණ පද්ධතියක් ස්ථාපිත කිරීමක් හෝ ගිවිසුම්ගත වීමක් හෝ සිදුව නොතිබියදී රු.12,770,000 ක් වියදම් ලෙස දක්වා ණය හිමි වෙන් කිරීමක් සිදු කර තිබුණි. | ඉදිරියේ දී අයවැය ප්‍රතිපාදන මේ සඳහා සකසා ගැනීමේ ගැටළුව නිසා අදාල මුදල 2023 ණය හිමි තුළින් වෙන් කිරිමට කටයුතු කරන ලද බව. | සත්‍ය වශයෙන් ගෙවීමට ඇති මුදල සඳහා පමණක් ණය හිමි ප්‍රතිපාදන ඇති කළ යුතුය. |
| (එ) | මිල ගණන් කැඳවීමක් හෝ ජෙනරේටරයක් ලබාගැනීමක් හෝ නොතිබියදී සමාලෝචිත වර්ෂයේදී වියදමක් ලෙස රු.5,331,709 ක් ද රු.5,198,715 ක ණය හිමි වෙන් කිරීමක් ද සිදුකර තිබුණි. | කඩිනමින් ගිණුම් ගැලපීමට ක්‍රියා කරනු ලබන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඒ) | මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වර්ෂය තුළ ලැබුණු මුද්දර ගාස්තු ආදායම වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම ලෙස සලකනු ලබන බවට දක්වා තිබුණ ද මුද්දර ගාස්තු ආදායම උපචිත පදනමට ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේ දී මුද්දර ගාස්තු චෙක්පත ලද පසු පමණක් ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | - එම - |

**1.6.3 නොසැසඳුණු පාලන ගිණුම් හෝ වාතර්ා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 13 කට අදාළ ශේෂයයන් ඒවාට අදාළ උපයෝගි ලේඛන/ වාර්තාවල දැක්වෙන ශේෂයන් සමඟ සැසඳීමේ දී රු.32,601,512 ක වෙනසක් නිරීක්ෂණය විය. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වෙනස්කම්වලට හේතු සොයා නිවැරදි කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ ) | මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු විශ්‍රාම වැටුප් දායක මුදල් ශේෂය රු.2,204,656 ක් වුවද විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් ලබා ගන්නා ලද තොරතුරු අනුව එම ශේෂය රු.46,923,629 ක් විය. ඒ අනුව රු.44,718,973 ක වෙනසක් නිරීක්ෂණය විය. | ගෙවිය යුතු මුදල් හඳුනාගෙන ගෙවීම් කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |

### 1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂයය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ලැබිය යුතු මස්කඩ ටෙන්ඩර් කුලී | 2,063,684 | උපලේඛන | උපලේඛන ඉදිරිපත් කර නැත. | උපලේඛන ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | ලැබිය යුතු බලපත්‍ර ගාස්තු | 4,326,324 | - එම - | - එම - | - එම - |
| (ඇ) | ලැබිය යුතු විනෝද බදු | 295,342 | - එම - | - එම - | - එම - |
| (ඈ) | ලැබිය යුතු VAT | 127,092 | - එම - | - එම - | - එම - |
| (ඉ) | ලැබිය යුතු ප්‍රවාරක දැන්වීම් | 8,711,264 | - එම - | - එම - | - එම - |
| (ඊ) | ලැබිය යුතු වෙනත් ලැබීම් | 189,879 | - එම - | - එම - | - එම - |
| (උ) | වෙනත් ලැබිය යුතු දෑ | 2,998,000 | ලෙජර් ගිණුම | 2024 ගිණුමෙන් නිවැරදි කරන බව. | අදාළ ලෙජර ගිණුම් ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරිය) 266 (අ) වගන්තිය | අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව රු.2,471,517 ක් වූ මස්කඩ ණය ගැතියෝ කපා හැර තිබුණි. | අමාත්‍යවරයාගේ අනුමැතියට යොමු කළ යුත්තේ ලැබිය යුතු සත්‍ය ආදායමක් කපා හැරීමකදී ය. මෙහිදි සිදුවී ඇත්තේ ගිණුම්වල දෝෂ නිවැරදි කිරීමක් බව. | පනත අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ.571 | වසර 02 ඉක්ම වූ රු.12,888,177 ක තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | 2024 අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව . | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්ම වූ ආදායම රු.810,103,015 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.976,156,225 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තු ආදායම, බිල්කළ ආදායම, රැස්කළ ආදායම හා හිඟ ආදායම්

කොමසාරිස්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම, බිල්කළ ආදායම, රැස්කළ ආදායම හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැ. 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැ. 31 දිනට මුළු හිඟය |
| | (රු.) '000 | (රු.) '000 | (රු.) '000 | (රු.) '000 | (රු.) '000 | (රු.) '000 | (රු.) '000 | (රු.) '000 |
| වරිපනම් හා බදු | 785,505 | 834,504 | 680,471 | 858,443 | 430,905 | 410,476 | 348,491 | 629,703 |
| කුලී | 15,798 | 20,522 | 29,439 | 13,661 | 29,732 | 20,678 | 22,389 | 20,107 |
| බලපත්‍ර ගාස්තු | 9,325 | 9,530 | 5,204 | 4,326 | 9,435 | 5,000 | 3,915 | 5,130 |
| වෙනත් ආදායම් | 16,456 | 20,381 | 24,778 | 13,887 | 18,133 | 17,030 | 14,240 | 24,188 |
| එකතුව | 827,084 | 884,937 | 739,892 | 890,317 | 488,205 | 453,184 | 389,035 | 679,128 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් හා බදු | | |
| (i) | සමාලෝචිත වර්ෂය සඳහා බිල් කරන ලද වරිපනම් ආදායම රු. 820,422,202 ක් වුවද ඉන් රු.327,001,165 ක් හෙවත් සියයට 40 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | 2024.03.31 දින වන විට හිඟයෙන් රු.113,352,685 ක් අය කර ගෙන ඇති බව හා පැවති අයහපත් ආර්ථික අර්බුදය හා කොරෝනා වසංගතය යන හේතූන් මත වරිපනම් ගෙවීමේ අඩාල වීමක් සිදුවූ බව හා දේපළ තහනම් කිරීම් වැනි කටයුතු වලට ද අවතීර්ණ | පනතේ විධි විධාන අනුව හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | වීමට ද අපොහොසත් තත්ත්වයක් උද්ගත වූ බව. | |
| (ii) | හිඟ ආදායම් වාර්තා අනුව සමාලෝචිත වර්ෂයේ ආරම්භක හිඟ වරිපනම් ශේෂය රු. 532,240,119 ක් වුවද ඉන් සමාලෝචිත වර්ෂය තුළ දී රු.105,332,307 ක් අය කර ගෙන තිබූ අතර රු.426,907,812 ක් හෙවත් සියයට 80 ක් අය කර ගැනීමට අපොහොසත් වී තිබුණි. | 2023 වාර්ෂික තක්සේරු මුදල වැඩි කිරීමට අදාලව තක්සේරු ප්‍රතිශෝධන වාර්තා ලැබීමේ දී සිදු වූ ප්‍රමාද දෝෂ නිසාත් අදාළ ප්‍රතිශෝධන සඳහා තීරණයක් ලැබීමේ දී සිදු වූ ප්‍රමාදය නිසාත් වරිපනම් බදු ගෙවීම ප්‍රමාද වූ බව. | - එම - |
| (iii) | හිඟ ආදායම් වාර්තා අනුව 2023 දෙසැම්බර් 31 දිනට දේපළ 47136 ක රු.763,796,919 ක වරිපනම් හිඟයක් පැවතුණි. මෙම හිඟය තුළ රු.50,001ත් රු.100,000 ත් අතර වටිනාකමකින් යුත් දේපළ 1265 කින් රු.89,785,947 ක් ද රු.100,000 ට වැඩි වටිනාකමකින් යුතු වරිපනම් ඒකක 1112 කින් රු.374,486,520 ක් ද අයවීමට තිබුණි. | දේපළ තහනම් කිරීමේ නිලධාරින් බඳවා ගැනීම ප්‍රමාද වීම හා නිලධාරීන් ප්‍රමාණවත් නොවීම මත හිඟය අය කර ගැනීමට ප්‍රමාද වී ඇති අතර 2013 වර්ෂයේ විශේෂ දේපළවලට අයත් තක්සේරු දැන්වීම් බෙදා හැරීමෙන් පසු නියමිත දිනට ගෙවීම් කළද දත්ත පද්ධතියට අධිභාර ගණනය වීම මත විශාල මුදලක් හිඟ ලෙස පෙන්වන බව. | - එම - |
| (iv) | සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විට සභාවට අයවිය යුතු කසල ගාස්තු ආදායම රු.15,568,418 ක් විය. | 2024 මාර්තු වන විට රු.3,351,369 ක් අය වී ඇති බව. | හිඟ කසළ ගාස්තු අය කර ගැනීමට කටයුතු කළ යුතුය . |
| (v) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පැවති හිඟ කේබල් ටී.වී ආදායම රු.3,063,101 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | හිඟ මුදල් අය කර ගත යුතුය. |
| (ආ) | **කුලී** | | |
| (i) | 2023 දෙසැම්බර් 31 දිනට නගර සභාව සතු කඩ කාමර 26 ක් කුලියට ලබා දීමට කටයුතු කර නොතිබුණි. | රත්මලාන නව වෙළඳ සංකීර්ණයෙහි කඩ කාමර කුලියට දීම සඳහා කටයුතු කරමින් පවතින බවද කොහුවල වෙළඳ සංකීර්ණයේ අංක 04 කඩ කාමරය ටෙන්ඩර් කිරීම සඳහා අවම ලංසුව තීරණය කර ගැනීමට තක්සේරු අංශය වෙත යොමු කර ඇති බව ද දෙහිවල වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 16 ක් අබලි තත්ත්වයේ පැවතීම සහ නාගරික සංවර්ධන | අදාළ කටයුතු සිදු කර කඩ කාමර කුලියට ලබා දිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | අධිකාරිය විසින් එම වෙළඳ සංකීර්ණය පවරාගෙන ඇති බැවින් අබලි කඩ කාමර තවදුරටත් සංවර්ධනය වීමක් සිදු නොවීම හේතුවෙන් කුලියට ලබා දීමට නොහැකි වූ බව. | |
| (ii) | බදුකරුවන් විසින් කුලියට ලබාගෙන ව්‍යාපාරික කටයුතු නොකර වසා දමා ඇති කඩ කාමර 53 ක් වෙළඳ සංකීර්ණ තුළ පැවති අතර 2023 දෙසැම්බර් 31 දිනට එම කඩ කාමරවලින් රු.1,892,236 ක මුදලක් අය වීමට පැවතුණි. එකී කඩ කාමරවලින් හිඟ කඩ කුලී අයකර ගැනීමටත් ගිවිසුම් ප්‍රකාරව සභාව වෙත පවරාගෙන අලුත්වැඩියා කර වෙනත් පාර්ශවයන්ට බදු දීමටත් කටයුතු කර නොතිබුණි. | අබලි වීම මත ව්‍යාපාරික කටයුතු නොකරන බව දන්වා ඇති අතර හිඟ අය කර ගැනීම සඳහා සිහි කැඳවීම් අදාළ බදුකරුවන් වෙත යවා ඇති බව. | හිඟ කුලී අය කර ගැනීමට හා ගිවිසුම් ප්‍රකාරව කඩ කාමර පවරා ගැනීම කළ යුතුය. |
| (iii) | 2023 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු5,658,694 ක් වූ කඩ කාමර 33 ක් මුද්‍රා තැබීමට කටයුතු කර නොතිබුණි. | එම කඩ කාමර මුද්‍රා තැබීම සඳහා සියළුම තොරතුරු ආදායම් පරීක්ෂක අංශය වෙත යොමු කර ඇති බව. | කුලී නොගෙවූ කඩ කාමර මුද්‍රා තැබීමට කටයුතු කළ යුතුය. |
| (iv) | සභාව විසින් බදු දී ඇති දේපළ 15 න් දේපළ 10 ක සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට හිඟ කුලිය රු.1,870,580 ක් විය. | හිඟ නොගෙවන දේපළ නගර සභාව වෙත පවරා ගැනීමට ආදායම් පරීක්ෂක අංශය වෙත යොමු කර ඇති බව හා සරණංකර පොලිස් මුරපොල වැනි දේපළ සඳහා පූර්ව ගිවිසුමක් දෙපාර්ශවය සතුව නොමැති වීම නිසා හිඟ අය කර ගැනීමට නොහැකි වී ඇති බව. | හිඟ කුලී අය කර ගත යුතුය. |
| (v) | 2023 වර්ෂය සඳහා බිල් කළ ව්‍යාපාර හා කර්මාන්ත බදු ආදායම රු 13,082,400ක් වුවද ඉන් රු 7,080,200ක් හෙවත් සියයට පනස් හතර ක් අය කර ගැනීමට නොහැකි වී තිබුණි. | ව්‍යාපාර බදු අයකර ගැනීමට සිහි කැඳවීම ලිපි තෙවරක්ම අදාල ව්‍යාපාර ස්ථාන කරා යවා ඇති අතර එසේ ගෙවීම් නොකරන ලද ව්‍යාපාර ලැයිස්තුව ප්‍රධාන ආදායම් පරීක්ෂක වෙත යොමු කර ඇති බව. | ව්‍යාපාර හා කර්මාන්ත බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුය |
| (vi) | 2023 ජනවාරි 01 දිනට පැවති රු.97,930,533 ක හිඟ ව්‍යාපාර හා කර්මාන්ත බදු ශේෂයෙන් සමාලෝචිත වර්ෂය තුළ රු.10,343,452 ක් පමණක් අය කර ගෙන තිබූ අතර රු.87,587,081ක් | හිඟ අය කර ගැනීම සඳහා සිහි කැඳවීම් තුනක් වර්ෂය තුළ ව්‍යාපාරික ස්ථාන වෙත යවා ඇති අතර හිඟ ව්‍යාපාරික බදු ලැයිස්තුව හිඟ අය කිරීමට සහ නීතිමය | හිඟ ව්‍යාපාර හා කර්මාන්ත බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| | හෙවත් සියයට 89 ක් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | ක්‍රියාමාර්ග ගැනීම සඳහා ප්‍රධාන ආදායම් පරික්ෂක වෙත යොමු කර ඇති බව. | |
| **(ඇ)** | **බලපත්‍ර ගාස්තු** | | |
| (i) | සමාලෝචිත වර්ෂය සඳහා බිල් කළ වෙළඳ බලපත්‍ර ආදායම රු.9,530,300 ක් වූ අතර රැස් කළ ආදායම රු.5,203,976 ක් විය. එය බිල් කළ ආදායමෙන් සියයට පනස් පහක් පමණක් විය. | 2023 වර්ෂයේ වෙළඳ බලපත්‍ර ලබා නොගත් ව්‍යාපාර ලැයිස්තුව නීතිමය ක්‍රියාමාර්ග මඟින් අය කර ගැනීම සඳහා ආදායම් පරීක්ෂක අංශය වෙත යොමු කර ඇති බව. | හිඟ ආදායම් අය කර ගත යුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂය සඳහා වෙළඳ බලපත්‍ර නිකුත් කළ යුතු වෙළඳසැල් 1943 ක් පවතින බව දක්වා තිබුණ ද වෙළඳසැල් 730 ක් සඳහා පමණක් බලපත්‍ර නිකුත් කර තිබූ අතර වෙළඳසැල් 1213 ක් බලපත්‍ර ලබා නොගෙන ව්‍යාපාර කටයුතු සිදු කර තිබුණි. | 2023 වර්ෂයේ වෙළඳ බලපත්‍ර ලබා නොගත් ව්‍යාපාර ලැයිස්තුව නීතිමය ක්‍රියාමාර්ග මඟින් අය කර ගැනීම සඳහා ආදායම් පරීක්ෂක අංශය වෙත යොමු කර ඇති බව. | බලපත්‍ර ලබා නොගත් ව්‍යාපාර සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියා මාර්ග ගත යුතුය. |
| **(ඇ)** | **වෙනත් ආදායම්** | | |
| (i) | සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව අසල, මුහුදුබඩ මාර්ගය දෙපස හා රත්මලාන දිනපතා පොළ ඉදිරිපිට යන ස්ථානවල වාහන නැවතුම්පල ගාස්තු අය කිරීමේ ටෙන්ඩර් ලබා ගත් තැනැත්තන් විසින් 2022 දෙසැම්බර් සිට 2023 මාර්තු දක්වා කාලයට අදාළ වාහන නැවතුම්පල ගාස්තු වශයෙන් රු.1,233,582 ක් සභාවට ගෙවා නොතිබුණි. කාර්යසාධන ඇපකර මුදල අඩු කළ විට තවදුරටත් රු.868,582 ක් අයවිය යුතුව පැවතිණි. | හිඟ මුදල් ගෙවන ලෙස ටෙන්ඩර්කරුවන් වෙත එන්තරවාසි නිකුත් කර තිබුණද හිඟ මුදල් නොගෙවූ බැවින් නීතිමය පියවර ගන්නා ලෙස 2024.01.24 දිනැතිව නීති අංශය වෙත ලිපිගොනු යොමු කර ඇති බව. | හිඟ මුදල් අය කර ගත යුතුය. |
| **(ii)** | සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනයට පැවති රු.17,821,343 ක හිඟ දැන්වීම් පුවරු ශේෂයෙන් සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.6,793,456 ක් තව දුරටත් අයවිය යුතුව පැවතුණි. | හිඟ අය කර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | හිඟ දැන්වීම් පුවරු ආදායම් අය කර ගත යුතුය. |

## 2.3 අධිභාර

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහා නගර සභා ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව විගණකාධිපතිවරයා විසින් 1995 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලය තුළදී පැනවූ අධිභාර වෙනුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට රු.2,437,078 ක් අයකර ගැනීමට තිබුණි. | මෝටර් කාර් රථයේ අධිභාරයේ වගඋත්තරකරුවන් මිය යෑම සහ ලිපිනය සොයා ගැනීමට නොහැකි වීම මත අයකර ගැනීමට නොහැකි වූ මුදල රු.137,312 කි. ලැප්ටොප් මිලදී ගැනීම සම්බන්ධයෙන් වූ අධිභාරයේ අදාළ කටයුතු කිරීමට පළාත් පාලන කොමසාරිස් වෙතින් උපදෙස් සඳහා 2022.05.31 දින ලිපියක් යවා ඇති අතර මෙතෙක් පිළිතුරු ලැබී නැත. පිළිතුරු ලිපියට අනුව ඉදිරි කටයුතු කිරීමට නියමිත බව. | අධිභාර මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ ඉඳුල් කසළ විකිණීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වුවද රු.17,443,650 ක වියදමක් දරා ඉඳුල් කසළ ටොන් 17444 ක් කරදියාන කසළ අංගනයට බැහැර කර තිබුණි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීමෙන් පසුව ද 2023 මැයි සිට දෙසැම්බර් දක්වා එකතු කරනු ලබන ඉඳුල් කසළ ටොන් ප්‍රමාණය සැලකිය යුතු ලෙස වැඩි වී තිබුණ ද සභාව විසින් කසළ වෙනත් පාර්ශවයකට විකිණීමට හෝ කොම්පෝස්ට් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර පොහොර විකිණීම කෙරෙහි අවධානය යොමු වී නොතිබුණි. | ගිවිසුම්ගත වූ පාර්ශවය විසින් සැලකිය යුතු ඉඳුල් කසළ ප්‍රමාණයක් රැගෙන නොයාම මත පෙර පරිදිම කරදියාන කසල අංගනයට බැහැර කිරීම සිදු කරන ලද අතර කොම්පෝස්ට් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් භූමි ප්‍රමාණයක් සොයා ගැනීමේ ගැටළුකාරී තත්ත්වය මත මේ වන තෙක් කොම්පෝස්ට් ව්‍යාපෘතියක් කිරීමට අවශ්‍ය ඉඩ ප්‍රස්ථා සකසා ගැනීමට නොහැකි වී ඇති බව. | කසළ තුලින් ආදායම් ඉපයීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | CFL බල්බ,ටෙම්පර්ඩ් ග්ලාස්, තහඩු, බේල් කළ මිශ්‍ර පොලිතින්, බේල් කළ ඇලුමිනියම් දවටන, ඇලුමිනියම් ආහාර ඇසුරුම්, භාවිතා කරන ලද පැරණි ටයර්,රබර් ආශ්‍රිත නිෂ්පාදන, ගස් අතු කොටස් හා කඳන්, ලී යතු කොටස්, සියලුම වර්ගයේ ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය, | 2023 හා 2024 වර්ෂයේ සුදුසු ගැනුම්කරුවන් ඉදිරිපත් නොවූ හෙයින් මෙම අපද්‍රව්‍ය අලෙවි කිරීමට නොහැකි වූ බව. | නොදිරන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුය. |

ඉවතලන දත් බුරුසු එකතු කිරීම හා බැහැර කිරීම පිළිබඳව ක්‍රමවේදයක් සභාව විසින් සකස් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් පාලන දෙපාර්තමේන්තුව (බස්නාහිර පළාත) විසින් 2002 මැයි 17 දින නිකුත් කළ වීථි ලාම්පු නඩත්තුව, දැල්වීම හා නිවීම යන ලිපියෙහි 02 වන කරුණ ප්‍රකාරව සෑම විදුලි කණුවක්ම නම් කර (අංක කර) යොදනු ලබන විදුලි බල්බය පවා සවිකළ දිනය සොයා ගැනීමට හැකි ගණන් තැබීමේ ක්‍රමයක් හඳුන්වා දීමට පියවර ගැනීම සභාවේ වගකීමක් බව දක්වා තිබුණද සභා බල ප්‍රදේශයේ සවි කර ඇති වීථි පහන් කණු හඳුනාගෙන අංක ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | මේ වන විට නගර සභා බල ප්‍රදේශය තුළ වීථි පහන් කණු අංක කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2024 අයවැය තුළින් රු.1,000,000 ක මුදලක් වෙන් කර ඇති බව. | විදුලි කණු අංක කළ යුතුය. |
| (ආ) | 1983 වර්ෂයේ සිට 2017 දක්වා කාලයක සිට පැවත එන සභාවට ලැබිය යුතු රු.1,735,225 ක තැන්පත් මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2024 වර්ෂය තුළ දී 1983 – 2017 දක්වා සභාවේ තැන්පත් මුදල් කාර්යය නිම වී ඇති නම් අදාළ ආයතනවලින් නැවත ලබා ගැනීමට කටයුතු කරන බව. | කාර්යය නිම වී ඇත්නම් තැන්පත් මුදල් ලබා ගත යුතුය. |
| (ඇ) | ඉඩම්, ගොඩනැගිලි, මංමාවත්, බෝක්කු හා අනිකුත් යටිතල පහසුකම් ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේ දී ඉඩම් හා ගොඩනැඟිලි ගිණුම්ගත කිරීම සඳහා අවශ්‍ය කටයුතු දැනටමත් සිදු කරමින් පවතින බව. | ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2019 වර්ෂයේ සිදු කරන ලද වරිපනම් බදු වංචාවට අදාළ වගකිව යුතු පාර්ශවය හඳුනාගෙන රු.145,490 ක් වූ එම මුදල අයකර ගත යුතු වන අතර සමාලෝචිත වර්ෂය අවසානයේදී ද එම මුදල අඩුවෙන් තැන්පතු කිරීම් ලෙස දක්වා තිබුණි. | විමර්ශන කටයුතු අවසන් කර, අවසන් තීරණය තවමත් ලැබී නොමැති නිසා මෙම මුදල නිරවුල් කිරීමට නොහැකි වී ඇති අතර, එම වරද සිදු කළ සේවක මහතාගේ සේවය අත්හිටුවා ඇති බව. | අදාළ මුදල් අය කර ගත යුතුය. |

## 3.3 වත්කම් කළමනාකරණය

**වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයේ මහා නගර සභාවට අයත් ඉඩම් කට්ටි 206 ක් හඳුනාගෙන තිබුණු අතර එම ඉඩම් වලින් ඔප්පු හෝ හිමිකම් සහතික ලබාගෙන තිබුණේ බිම් කට්ටි 48 ක් සඳහා පමණි. | ඔප්පු රහිත සියළු ඉඩම් සඳහා හිමිකම් සහතික ලබා ගැනීමට සභාව තීරණය කර ඇති බව. | ඉඩම් වලට ඔප්පු/ හිමිකම් සහතික ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.4 ප්‍රසම්පාදන කළමණාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 නොවැම්බර් 31 දිනැති ප්‍රසම්පාදන කමිටුව කෝලාස් බැරල් එකක් රු.28,800 කට මිලට ගැනීමට නිර්දේශ කර තිබුණද 2023 දෙසැම්බර් මස බැරල් එකක් රු.33,000 බැගින් බැරල් 15 ක් වෙනත් ආයතනයකින් මිලදී ගැනීමෙන් රු.63,000 ක් වැඩිපුර ගෙවීමට සිදු වී තිබුණි. | ටෙන්ඩර් ක්‍රියා පටිපාටිය අවසන් වන තෙක් වැඩබිමේ කාර්යයන් අඛන්ඩව පවත්වා ගෙන යෑමේ අරමුණින් 50% පදනම් කර ගෙන පෙර සැපයුම්කරු වෙත ඇණවුම ලබා දුන් බව. | සභාවට වාසිදායක වන පරිදි කටයුතු කළ යුතුය. |
| (ආ) | කෝලාස් බැරල් 01 ක් රු.34,200 බැගින් බැරල් 25 ක් 2023 අප්‍රේල් 06 දින ඇණවුම් කර තිබුණද භාණ්ඩ ගබඩාවට ලැබී තිබුණේ 2023 නොවැම්බර් 21 දින වේ. නමුත් මෙම කාලය තුළ බැරල් එකක මිල රු.28,800 දක්වා පහත බැස තිබුණද ඇණවුම අවලංගු නොකිරීම හේතුවෙන් රු.135,000 ක් වැඩිපුර ගෙවීමට සිදු වී තිබුණි. | මෙවැනි සිදුවීම් මින් ඉදිරියට සිදු නොවන ආකාරයට කටයුතු කිරීමට වග බලා ගැනීමට තරයේ උපදෙස් ලබා දී ඇති බව. | විධිමත් පරිදි මිලදී ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මිහිදු මාවත සායන ගොඩනැගිල්ලේ කායවර්ධන මධ්‍යස්ථානයක් ඉදි කිරීමේ කොන්ත්‍රාත්තුව කොන්ත්‍රාත්කරු විසින් සියයට 40 ක වැඩ කොටසක් පමණක් තිබියදී සියයට 60 ක මිල වැඩි වීමක් හා | මෙම ව්‍යාපෘතියේ ඉතිරි කොටස් ඉටු කිරීම සඳහා යෝග්‍ය තාක්ෂණික දැනුමක් සභාව යටතේ සිටින සේවකයන්ට නොමැති බැවින් ඇස්තමේන්තු සකසා සභාවේ | ව්‍යාපෘතියේ ඉතිරි වැඩ කොටස් සම්පූර්ණ කර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කාලය දීර්ඝ කිරීමක් ඉල්ලා තිබුණු බැවින් කොන්ත්‍රාත්තුවේ ඉතිරි වැඩ කොටස් සභා සේවකයින් මඟින් ඉටු කර ගැනීමට 2022 නොවැම්බර් මහා සභාවේදී තීරණය කර තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එහි ඉතිරි වැඩ කොටස් ආරම්භ කර නොතිබුණි. | ලියාපදිංචි කොන්ත්‍රාත් ආයතනයක් මඟින් ඉටු කිරීමට මේ වන විට කටයුතු සිදු කරමින් පවතින බව. | |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී ව්‍යාපෘති 04 ක් සඳහා රු.206,335,022 ක් වෙනුවෙන් අයවැය ප්‍රතිපාදන සලසා ගෙන තිබුණද එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන නොතිබුණි. | රටේ පැවතියා වූ ආර්ථික අර්බුදය හේතුවෙන් ගොඩනැගිලි ද්‍රව්‍ය මිල අසාමාන්‍ය ලෙස වැඩි වීම නිසා මෙම ව්‍යාපෘති ඉටු කිරීම නවතා දමන ලදී. නමුත් ණයහිමි ලෙස ප්‍රතිපාදන ඉදිරි වර්ෂ සඳහා වෙන්කරවා ගෙන ඇති අතර ඒ අනුව මෙම ව්‍යාපෘති ඉටු කිරීම සඳහා බලාපොරොත්තු වන බව. | අයවැය ප්‍රතිපාදන සලසා තිබූ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.6 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්‍රාම ගිය, මිය ගිය හා ස්ථාන මාරු වී ගිය සේවකයින්ගෙන් රු.4,412,457 ක ණය ශේෂයක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | එම ණය ශේෂයන් වලට අදාළ ණයකරුවන් පිළිබඳ විස්තර සොයා ගැනීම අපහසු වී ඇති නමුත් එම ණය ශේෂ සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා විශේෂ කළමනාකරණ කමිටුවෙහි අනුමැතියට යටත්ව කමිටුවක් පත් කර ඇති අතර එමඟින් ඉදිරියේ දී එම මුදල අය කර ගැනීම සම්බන්ධයෙන් පියවර ගැනීමට නියමිතව ඇති බව. | හිඟ ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.7 වාහන පද්ධතිය කළමණාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව සතුව අක්‍රිය තත්ත්වයේ වාහන 22 ක් පැවති අතර ඒවා අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරිමට කටයුතු කර නොතිබුණි. | එම වාහන හා යන්ත්‍රෝපකරණ අළුත්වැඩියා කිරීම ආර්ථිකමය වශයෙන් ඵලදායි නොවන බැවින් එකී වාහන හා යන්ත්‍රෝපකරණ මෙම වසරේ දී අපහරණය කිරීමට කටයුතු කරනු ලබන බව. | අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |